# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1815/12 - 2013 ජුනි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2013.06.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වන වගන්තිය යටතේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ බලතල පැවරීම සම්බන්ධයෙන් වූ නියමයයි**

බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර සෙයිද් අලවි මව්ලානා වන මම 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දීප ව්‍යාප්ත සේවාවන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලයට අගතියක් නොවන පරිදි පහත උපලේඛනයේ සඳහන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තනතුරු සම්බන්ධයෙන් නිලධරයන් පත්කිරීම, මාරුකිරීම, තනතුරෙන් ඉවත්කිරීම හෝ සේවයෙන් පහකිරීම ඔවුන්ගේ විනය පාලනය (අදාළවන පමණට) සම්බන්ධයෙන් වන බලතල මවිසින් ක්‍රියාත්මක කිරීමට යටත්ව ; එම බලතල හැර බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ සෙසු සියළු තනතුරු සම්බන්ධයෙන් පත්කිරීම, මාරුකිරීම, සේවයෙන් පහකිරීම, ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් බලතල 2013ක් වූ ජුනි මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මෙයින් පවරා දෙමි.

තවද මෙසේ පවරා දෙන බලතල සම්බන්ධයෙන් 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධිත) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(2අ) උප වගන්තිය යටතේ සඳහන් බලතල අනුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාකිරීමේදී ඒ සම්බන්ධයෙන් විශේෂිතව මවිසින් නියමයන් නොකරන තාක් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි එම බලතල බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් හෝ යම් නිලධරයෙකු වෙත පවරාදීම සඳහා බලය හා අවසරය දෙමි. එසේම එලෙසින් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවරාදෙනු ලබන බලතල ක්‍රියාත්මක කිරීමේදී අතෘප්තියට පත්වන පාර්ශවයකට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනය කිරීමට අයිතිවාසිකම් ඇති බවටත්, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයට අදාළව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණයකින් අතෘප්තියට පත්වන අයකුට බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා වෙත අභියාචනය කිරීමට අයිතිවාසිකම් ඇති බවටත් මෙයින් නියමකොට ප්‍රකාශ කරමි.

තවද, මෙම බලතල පැවරීම ක්‍රියාත්මක වන දිනට පෙර දිනෙන් ක්‍රියාත්මක වන පරිදි 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ බලතල පැවරීමට අදාළ නියමයන් එකී නියමයන් යටතේ ගන්නා ලද කිසිදු ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි මෙයින් පරිච්ඡින්න කරමි.

එස්. අලවි මව්ලානා,<br>
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර.

2013 ජුනි මස 10 වැනි දින,<br>
කොළඹ 05,<br>
හැව්ලොක් පාර,<br>
අංක 98/4,<br>
බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

* බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම්
* බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම්
* බස්නාහිර පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්
* බස්නාහිර පළාතේ පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්
* බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්
* බස්නාහිර පළාතේ පළාත් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්
* බස්නාහිර පළාතේ මහනගර සභාවල නාගරික කොමසාරිස්වරුන්
* බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂවරුන්
* බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ, කළුතර පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන්
* බස්නාහිර පළාතේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
* බස්නාහිර පළාතේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
* බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී
* බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී (ගිණුම් හා ගෙවීම්)
* බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී (අයවැය)
* බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී (මුදල් හා ආදායම්)
* බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (සැලසුම්)
* බස්නාහිර පළාතේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්)
* බස්නාහිර පළාතේ මානව සම්පත් සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ
* බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (ගොඩනැගිලි)
* බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (ඉංජිනේරු)

07 - 90

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.